පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක - 2025/15

NCP/CS/PT/AP/02/Authority/01
පළාත් භාණ්ඩාගාරය,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත,
2025.12. 30

ව්‍යවස්ථාපිත ආයතන වල සභාපතිවරුන් සහ
ආයතන ප්‍රධානීන් වෙත.

**ව්‍යවස්ථාපිත ආයතන වල වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරිම - 2025.**

පළාත් සභාවේ ප්‍රඥප්ති මගින් පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතන වෙනුවෙන් එක් එක් මුදල් වර්ෂය අවසානයේදී අදාළ ප්‍රඥප්ති වල සඳහන් විධිවිධාන අනුව අවසාන ගිණුම් සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිම සියළුම ව්‍යවස්ථාපිත ආයතන වල සභාපතිවරුන්ගේ වගකීමක් වේ.

02. ඒ අනුව 2025 වර්ෂය සඳහා සකස් කරනු ලබන අවසාන ගිණුම් අදාල ප්‍රඥප්ති මගින් නියම කර ඇති දිනට හෝ 2026.02.28 යන දින දෙකෙන් ප්‍රථමයෙන් එළඹෙන දිනට පෙර සකස් කර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

03. අවසාන ගිණුම සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී පහත උපදෙස් අනුගමනය කළ යුතුය.

3.1 වාර්ෂික ගිණුම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ (ශ්‍රී.රා.අ.ගි.ප්‍ර) ප්‍රමිතීන්ට අනුකූලව උපචිත පදනම මත සකස් කළ යුතුය.

3.2. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 ට අනුව මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් සංරචකයන් ගෙන් සමන්විත විය යුතුය.

(අ). මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය.

(ආ). මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය.

(ඇ). ශුද්ධ වත්කම්/ ස්කන්ධයේ වෙනස්වීම

(ඈ). මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

(ඉ.). ව්‍යවස්ථාපිත ආයතන විසින් අනුමත කළ අය වැය ලේඛනයක් නිකුත් කර ඇත්නම් මූල්‍ය ප්‍රකාශණ තුල අය වැය ගත සංඛ්‍යා සහ සත්‍ය සංඛ්‍යා අතර සංසන්දනයක් ලෙස සහ පෙර වර්ෂයේ දත්ත සමඟ සංසන්දනාත්මකවත්

(ඊ). වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල හෙළිදරව් කිරීම් සහ අනෙකුත් විස්තරාත්මක සටහන්

3.3. ගිණුම් පිළියෙල කිරිමේදි සිංහල, ඉංග්‍රිසි සහ දෙමළ යන භාෂාත්‍රයෙන් වෙන වෙනම පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

3.4. ගිණුම් ඉදිරිපත් කිරීමේදී දෝෂ වලින් තොර විය යුතු අතර මීට පෙර වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලට අදාලව එවා ඇති විගණන විමසුම් වලට හා විගණකාධිපති වාර්තා වලට අවධානය යොමු කොට එමගින් පෙන්වා දෙන ලද අඩුපාඩු වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3.5. ඉහත උපදෙස් පරිදි සකස් කර සහතික කරන ලද ගිණුම් පිටපත් 05 න් එක් පිටපතක් පළාත් භාණ්ඩාගාරයට හා පිටපත් 04ක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අතර, ගිණුම් සහතික කිරීමෙන් පසු විගණකාධිපතිවරයා විසින් පහත සඳහන් පරිදි එම ගිණුම් බෙදාහරිනු ලැබේ.

| | | |
|---|---|---|
| 1. මුල් පිටපත | - | පළාත් භාණ්ඩාගාරයට |
| 2. පළමු අනුපිටපත | - | අදාළ අමාත්‍යාංශයට |
| 3. දෙවන අනුපිටපත | - | ගිණුම් ඉදිරිපත් කළ ආයතනයට |
| 4. තෙවන අනුපිටපත | - | විගණකාධිපති විසින් රඳවා ගනු ලැබේ. |

04. ඒ අනුව, ඉහත උපදෙස් පරිදි සකස් කරන ලද ගිණුම් නියමිත දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙස දන්වන අතර සියළුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සහ ගණන් දීමේ නිලධාරීන් විසින් මෙම කාර්ය නිසිපරිදි ඉටුකරනු ඇතැයි අපේක්ෂා කරමි.

ජේ.එම්.ආර්.පී. ජයසිංහ,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

| පිටපත්:- | | | |
|---|---|---|---|
| | 01.සියළුම අමාත්‍යාංශ ලේකම්වරු | - | දැ.පි |
| | 02.විගණකාධිපති | - | දැ.පි. |
| | 03 . ප්‍රධාන අභ්‍යන්තර විගණක , අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපා. | - | දැ.පි . |